### කවරයට වැඩි යමක්...

# ඇබ්බැහියෙන් මිදෙමු

**අඛණ්ඩව තුන්වෙනි වසරටත් ඇදී යමින් තිබෙන යුක්රේන යුද්ධය සඳහා ට්‍රම්ප් පාලනය වෙනස් මාර්ගයක් අනුගමනය කරනවා ඇත යන්න, රුසියාවේ මතු නොව ලෝක සමාජවාදී මනසේ ද බලාපොරොත්තුව වන්නේය. 2022 පෙබරවාරි මාසයේදී රුසියාව සිදු කළ ආක්‍රමණයෙන් පසුව මේ වෙන තෙක් යුක්රේනය වෙත එක්සත් ජනපදය ලබා දී ඇති මුදල ඩොලර් බිලියන 175කට අධිකය. නේටෝ සංවිධානය ලබා දී ඇති මුදල් කන්දරාව ඩොලර් බිලියන පනහ ඉක්මවා ගොස් ඇත්තේය.**

ලෝක බලතුලනය සඳහා මේ ආකාරයේ ආයෝජනයක් නව ලිබරල්වාදය සිදු කරන්නේ පෙරළා එන ප්‍රතිලාභය නියමිත පරිදි ගණන් තබාය. මේ රටේ ඇති ආයෝජන ප්‍රවර්ධන කලාප, ආයෝජකයා වෙත ලිහිල් පදනම යටතේ සිය සේවා සහ භාණ්ඩ නිෂ්පාදනය සඳහා තෝතැන්නක් වන්නා සේ, ලිබරල් ආර්ථික දේශපාලන රටාව සඳහා, රටක අත හුරු කළ විට එය අවසානයේ සේවය කරනුයේ ධනවාදී කඳවුරටය. එය අවසානයේ මිදිය නොහැකි හුරුවක් බවට පත්වූ විට ජනයා එයින් ඉවතට පැනීම හෝ ඒ මගේ සාධනීය වෙනසක් සිදුවෙනවා දැකීමට උග්‍ර අකමැත්තක් දක්වන්නේය.

ප්‍රශ්නය මුල් ඇද ඇති ස්ථානය තෙක් ගොස් බලන විට, අප සිරව ඇත්තේ ලිබරල්වාදයේ බලහත්කාරකම මත්තේ බව පෙනී ගියද, මතවාද සහ අඛණ්ඩ ඇබ්බැහිය හේතුවෙන් එයින් මිදෙන මංපෙත සඳහා සමාජයක් යන්නෙම නැත. ලංකා ආර්ථිකයේ බංකොලොත්භාවය සඳහා හේතුව වුයේ 1977 ආර්ථික ප්‍රතිසංස්කරණයය. හැත්තෑ හතේ වෙනස, සිය තරගය නිමා කරන ලද්දේ බංකොලොත්භාවය ලෙස සටහන් වූ පීත්ත පටිය කඩාගෙනය.

ඒ සඳහා වගකිව යුත්තා ධනවාදය වුවද, ගුටි කන්නේ බැණුම් අසන්නේ වෙනත් අන්තයක්ය. මේ කඩාගෙන වැටීම සඳහා සේලයින් දීමට පැමිණෙන්නේ ද නව ලිබරල්වාදය බිහි කළ රොබට් මැක්නමරාගේ ලෝක බැංකු බලකායය. මුල්‍ය අරමුදල පිටියට පිවිසෙන්නේ තමන්ගේ ක්‍රමය විසින්ම ගරා වට්ටන ලද ආර්ථිකය සඳහා කිහිලිකරු ලබාදීමටය. වෙනදා මුල්‍ය අරමුදලට රුචි නොවූ ශ්‍රීලනිප මූලික කඳවුරු පවා ඒ කෙරෙහි සංයමයකින් ක්‍රියා කරන ආස්ථානයක් දක්වා පැමිණියේ මේ හිරවීමෙන් ගැලවෙනු පිණිසය. අවසානයේ මේ රටේ සමස්ත ආර්ථික න්‍යාය පත්‍රයම මුල්‍ය අරමුදල සඳහා ලබාදී අත පිසදා ගැනීමට පසුගිය ආණ්ඩුව කටයුතු කළේය. එවැනි න්‍යාය පත්‍ර ගතවීමක් වීර ක්‍රියාවක් බවට පත්ව, එම පිරිස් අනෙකාට ප්‍රසිද්ධියේ අභියෝග කළේ, මෙම න්‍යාය පත්‍රය වෙනස් කරනවද නැද්ද යන්න අසමිනි. මේ ලිබරල් බංකොලොත්වාදය සඳහා විසඳුම් එය නොවන හෙයින් ද, එය දැටමත් සිතියම් ගත කර ඇත්තේ හෙයින් එකවර ඉවත්ව යා නොහැක්කේ හෙයින් ද වමේ පිළිතුර එකවිටම ඔව් සහ නැහැ යන්නට බර වුවේය.

මුල්‍ය අරමුදල සමග කටයුතු කරනවා යන්න වාම දේශපාලනයෙන් පිළිතුර ලබා දෙන්නේ, එයින් එකවිට බැහැර නොවිය හැක්කේ බැවිනි. එවිට වහා ලබාදෙන පිළිතුර වනුයේ "එහෙනම් මොකටද මාලිමාව, සිලින්ඩරේ කරන්නෙත් ඒ ටිකමනේ" කියාය. මුල්‍ය අරමුදලේ සමහර කාරණා සම්බන්ධයෙන් ප්‍රතිසංස්කරණ යෝජනා කරන කල්හි, වමට ඒ සඳහා ලැබෙන ප්‍රතිචාරය වන්නේ "ආයෙත් තෙල් පෝලිම් ඇති කරන්න ද යන්නේ" කියාය. කොයි පැත්ත කියුවද, වැඩේ වමේ ගැසීම, දැන් රිද්මය බවට පත්ව ඇත්තේය. බංකොලොත් වූ හේතුව, බංකොලොත් භාවය මත්තේ මුල්‍ය අරමුදලේ රට හිර කළේ කවුරුන්ද යනාදී සියල්ල පසෙක ලා, හෝද හෝදා වමේ දැමීමේ වන්නම දැන් ක්‍රියාත්මකය. මේ එක් කාරණයක් පමණය. ශ්‍රී ලන්කන් ගුවන් සේවය පුද්ගලීකරණය කරනවාද නැද්ද, යැයි ඇසුවිට එය පාඩු ලබන බැවින් රජයට තවදුරටත් පාඩු ඉවසාගෙන ගමන් කළ නොහේ හෙයින් ප්‍රතිසංස්කරණයක් කළ යුතු යැයි කිවහොත්, විකුණා දැමීමට හදනවා යන චෝදනාවය. රජයේ ආයතනයක් ලෙස පවත්වාගෙන යනවා කියුවහොත්, පාඩු ලබන සුදු අලි සඳහා මහජන ,මුදල් නාස්ති කිරීමක් බවට හඬ දෙන්නේය. එතැනදී ද පහර වමටය.

මේ ගැන කතිකාවක් සඳහා  මෙවර ප්‍රවේශ සිය කවරයේ කතාව වෙන් කරනුයේ, ලිබරල් පියවරුන් සහ එහි දාසයන් සිය හේතු පාඨ සඟවාගෙන, සියල්ල 'වමේ' ගැසීමේ මොහොත දැන් එළඹ ඇති බැවිනි.



**ශ්‍රී ලංකාව වසර 2022 මාර්තු මාසයේදී IMF ණය පහසුකමක් ලබාගැනීමට ඉල්ලුම් කරන ලදී.  එය වසරකට පසුව එනම් 2023 මාර්තු 20 වැනි දින අනුමත විය.  එම ණය පහසුකම ලබාගැනීමේදී ශ්‍රී ලංකා රජය විසින් ඉටුකර ගත යුතු කොන්දේසි සහ ඉලක්ක රාශියක් සමඟින් දෙපාර්ශ්වය අතර එකඟතාවයකට එළඹෙන ලදී.  එම  IMF ණය වැඩසටහනේ අන්තර්ගතය පිළිබඳව පොදු මහජනතාව දැනගත යුතුව තිබේ.**

# රට කෙලින් IMF මැදින්

එමෙන්ම එම ණය වැඩසටහනේ ශ්‍රී ලංකාවට වසර 2023 මාර්තු 20 සිට මාස 48ක පමණ කාලයක් තුළ ශ්‍රී ලංකාව ප්‍රතිපත්ති සහ ආර්ථික ප්‍රතිසංස්කරණවලට සහාය වීමට ආධාරකයක් ලෙස එක්සත් ජනපද ඩොලර් බිලියන 03ක (එස් ඩී ආර් බිලියන 2. 286) පමණ වූ ණය පහසුකම් ලබා දීමට එකඟ විය.

මෙය මුළුමනින්ම  IMF මඟින් හුදෙක් ණය මුදලක් ලබා දීමක් නොව අර්බුදයට ලක්වී ඇති ආර්ථිකය ඉදිරි මාස 48ක කාලය තුළ ස්ථායිකරණය කිරීම සඳහා රජයේ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ලබාදුන් දිරිදීමක් විය.  රජයේ ආර්ථික කළමනාකාරිත්වය වඩාත් විනිවිද භාවයෙන් යුතුව, කාර්යක්ෂමව, අල්ලස, දූෂණය, වංචාවෙන් තොරව වඩාත් ඵලදායි ලෙස ක්‍රියාවට නැංවීමට මඟ පෙන්වීමක් මේ තුළින් ලබා දී තිබිණි.

අපගේ රටේ ගෙවුම් ශේෂ දුෂ්කරතාවයන් පියවා ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව විදේශීය සංචිතය තර කර ගැනීමට මෙම අරමුදලේ ණය පහසුකම භාවිත කර ගත යුතු වේ. එම මුදලින් මේවන විට ඩොලර් මිලියන 333 බැගින් පළමු වාරිකය සහ දෙවැනි වාරිකය ලබා දී ඇත.

මේ දිනවල මෙරටට පැමිණ සිටි  IMF නියෝජිතයෝ එම ණය පහසුකමේ තුන්වැනි වාරිකය එනම් ඩොලර් මිලියන 333ක මුදල ලබා දීම සඳහා වූ කාර්ය මණ්ඩල එකඟතාවය පළකොට ඇත. එය IMF හි විධායක මණ්ඩලයට ඉදිරිපත් කොට ලබන මාසය වනවිට එය මෙරටට නිදහස් කර ගැනීමට බොහෝ දුරට හැකිවනු ඇත.

රාජ්‍යය ආදායම් ඉහළ නංවා ගැනීම, සමාජ ආරක්ෂණ ජාලය ගොඩනැඟීම, රාජ්‍ය මූල්‍ය ආයතන ප්‍රතිසංස්කරණය, පිරිවැය පියවෙන බලශක්ති මිළ ගණන් පවත්වා ගෙන යාම ආදී කරුණු ගණනාවක් සම්බන්ධයෙන් දෙපාර්ශ්වය එකඟතා වැඩසටහනකට එළැඹ තිබේ. එම එකඟතා මත නැවත වතාවත් ශ්‍රී ලංකාවේ ආර්ථිකය බංකොළොත් භාවයට පත් නොවන තැනට වග බලා ගැනීමට රජයේ පාර්ශ්වය ප්‍රතිසංස්කරණ ගණනාවක් සිදු කොට රට නිවැරැදි මඟට යොමු කිරීමට කටයුතු කළ යුතුව ඇත.

එවන් දැඩි මූල්‍ය විනයක් සහ ආර්ථික කළමනාකරණය නිවැරැදි ගමන් මඟක් අපේක්ෂා කරමින් කටයුතු කරන අතරම සමාජ සුභසාධන වියදම් ඉහළ නංවා ගැනීම රජය මුහුණ දෙන ප්‍රධාන අභියෝගයකි. මේ අවස්ථාවේ ශ්‍රී ලංකාවේ ජනතාව ඉතා විශාල ලෙස දරිද්‍රතාව, විරැකියාව, විෂම ආදායම් බෙදීයාම වැනි නරක දර්ශක සමඟ පොර බදිමින් සිටී. ජීවන වියදම අහස උසට නැඟ ඇත. එවන් පරිසරයක ජනතාවට වඩාත් පහසුවෙන් සහ සාධාරණ මිල ගණන් යටතේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මෙන්ම අනෙකුත් අත්‍යාවශ්‍ය වියදම් පියවාගැනීමට සවිමත් ජීවනෝපායක් නිර්මාණය කළ යුතුව තිබේ. මේ සඳහා රජය විශාල මුදලක් සුබ සාධක වියදම් ලෙස දැරිය යුතු වේ. අනික් පාර්ශ්වය රජයේ ආදායම් අය  කර ගැනීමේදී අනුගමනය කරන පුද්ගල ආදායම් බදු ඇතුළු අනෙකුත් බදු ප්‍රතිශත පහළ දැමීමක් හෝ සංශෝධනය කිරීමක් කළ යුතු යැයි විශාල හඬක් නැගේ. මේ දෙයාකාර ජනතා ඉල්ලීම් දෙකම සාර්ථකව ඉටුකරමින් IMF සමඟ ඇතිකර ගත් එකඟතා බිඳ දමාගැනීමකින් තොරව ඉදිරියට යාම අතුරේ යන ගමනක් හා සමානය.

එහිදී රජයට විශාල ශක්තියක් වී තිබෙනුයේ අල්ලස, දූෂණය, නාස්තිය නැති කිරීමට ජනාධිපතිවරයාගේ සිට ඇමති මණ්ඩලයේ පමණක් නොව වත්මන් දේශපාලන පාලනාධිකාරියේ තිබෙන කැපවීමය. ජනාධිපතිවරයා ප්‍රමුඛ රජය මුළුමනින්ම නාස්තිය, දූෂණය අවම කිරීමට නොව මුලිනුපුටා දැමීමට අධිෂ්ඨාන කරගෙන කටයුතු කරයි. එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දැඩි ප්‍රශංසාවට ලක්වූ කරුණකි.

**එවන් දැඩි මූල්‍ය විනයක් සහ ආර්ථික කළමනාකරණය නිවැරැදි ගමන් මඟක් අපේක්ෂා කරමින් කටයුතු කරන අතරම සමාජ සුභසාධන වියදම් ඉහළ නංවා ගැනීම රජය මුහුණ දෙන ප්‍රධාන අභියෝගයකි. මේ අවස්ථාවේ ශ්‍රී ලංකාවේ ජනතාව ඉතා විශාල ලෙස දරිද්‍රතාව, විරැකියාව, විෂම ආදායම් බෙදීයාම වැනි නරක දර්ශක සමඟ පොර බදිමින් සිටී.**

**ජයසිරි මුණසිංහ**

# ඒ අපේ අවසන් හමුවයි

**පසුගිය සතියේ පළවූ ලිපියෙහි ඉතිරි කොටස...**

අප අවසන් වරට හමුවූ අවස්ථාව ද මගේ දිවියෙහි නොනැසෙන මතකයකි. ඒ අසූ නවය වසරේ මධ්‍ය භාගයයි. ඒ වනවිට අපේ ඉරණම කෙටෙනයුරු පැහැදිලිව දක්නට ලැබෙමින් පැවතිණි. උදේ එකට මඟට බැස විවිධ වගකීම් දරා යන සහෝදර සහෝදරියන් සවස හමුනොවන අවස්ථා වැඩි වෙමින් පැවතිණි. හමුදා ඇඳුම් අන්දවා මහ මඟ තබාගෙන සිටිනා සටන් සගයන්ගේ දෙනෙත් මඟහැර යෑම දෛනික අත්දැකීමක් බවට පත්වෙමින් තිබිණි. මහ මඟ දැවෙන ටයර් සෑයන් පසුකර යන වේදනාබර නිමේෂයන් මෙන්ම තමන් සමඟ එකට සිටි සගයකුගේ සිරුර දැවෙන සිරුර අතරෙහි කිසියම් සලකුණකින් හඳුනා ගන්නට ලැබීම වඩ වඩා සුලබ වෙමින් පැවතිණි.

මා ඒ වනවිට නතරව සිටියේ රත්මලාන මැලිබන් හන්දිය ආසන්නයේ අතුරු මාවතක බෝඩිම් කාමරයකය. ඒ තවත් සගයකු ද සමඟිනි. අප පෞද්ගලික ආයතනයක සේවය කරන්නවුන් බව හැඟවෙන හොර කාර්යාල හැඳුනුම්පතක් මවෙත තිබිණි. එක් සවසක මා මගේ සගයා ද සමඟින් බෝඩිම කරා එද්දී එහි හිමිකාරියගේ යෞවන පුත්‍රයා හති දමමින් අප හමුවට දිව ආවේය.

'අයියෙ බෝඩිමට හමුදාවෙන් පැන්නා. අයියලගෙ කාමරේ අනිත් පැත්ත පෙරළල බලලා ගියා. අම්මා අයියලට මේ පැත්ත පළාතෙ ඉන්න එපා කියන්න කිවුවා.'

එහෙත් එක්වරම පලා යන්නට මට සිත දුන්නේ නැත. ඒ මගේ කාමරයෙහි මා බෙහෙවින් ඇලුම් කළ පොත් ගණනාවක් තිබූ හෙයිනි. එහෙයින් රැවන තුරු බලා සිට ආරක්ෂාව ගැන සැලකිලිමත් වෙමින් නිවෙසේ හිමිකාරියගේ විරෝධයද මැද (ඇය විරෝධය පෑවේ උදක්ම අපේ ආරක්ෂාව ගැන සිතාය.) කාමරයට පිවිසියෙමි. එහිවූ මෙට්ට කොට්ට පවා ඉරා දමලාය. මුළු කාමරයම සුනාමියකට හසුවූ විටෙක මෙනි. මම මගේ පොත් ගෙන සගයා සමඟ පලා ගියෙමි. ඉන්පසු මගේ නවාතැන බවට පත්වූවේ ගල්කිස්සේ වෙනත් තැනකි. සගයා තවත් තැනකට ගියේය.

මේ ආසන්න දිනෙක මම පානදුරය බලා යන්නට තීරණය කළෙමි. ආරක්ෂාව තිබූ ස්ථාන ආරක්ෂක අංශ සහ වෙනත් සන්නද්ධ කල්ලිවල ගොදුරු බිම් බවට පත්වෙමින් පැවති තත්ත්වයක අපට ආරක්ෂාව සහ ආහාරපාන සැපයූ බොහෝ පුද්ගලයන්, ඔවුන්ගේ ආරක්ෂාව තකා මඟ හරින්නට සිදුව තිබිණි. ආර්ථික අපහසුකම් මැද කුසගින්න දෛනික ගමන් සගයා බවට පත්වූවේය. දෙනෙත් දැවෙමින් පැවතියේ නිදිවර්ජිත රාත්‍රී කාලවල වන්දිය ලෙසිනි.



ඉදින් මම පානදුර, ගොරකාන කනත්ත ආසන්නයේ මගේ පාසල් මිතුරකුගේ නිවෙස බලා යාමට තීරණය කළෙමි. ඒ බඩට යමක් දාගෙන පොඩි නින්දක් ලැබීමේ අරමුණිනි. ඉතාම අසීරු සමයන්හිදී අපේ බඩ පිරවූ එක් ස්ථානයක් වූවේ ඒ නිවෙසයි. මිතුරාගේ නැගණිය ද අපේ සරසවියෙහි උගත් අතර ව්‍යාපාරික පවුලක් වූ හෙයින් ඔවුන්ගේ නිවෙස සැකයකට භාජනය නොවන වටපිටාවක් ද තිබිණි. ඉදින් මම බසයෙන් බැස තුන් කල් බලා පාර පැන කනත්ත හරහා මිතුරාගේ නිවෙස කරා ගොස් ඉදිරි දොරෙහි සීනුව නාද කර බිත්තිය අයිනට

**එදා සන්ධ්‍යාවේදී මම ඇගෙන් සමු ගතිමි. ඇය එදින එහි නතර වූවාය. ඉන්පසු අප හමුවූවේ නැත. විජේවීර ඇතුළු ජවිපෙ ඉහළ නායකයන්ගේ ඝාතනයන් සමඟ අප බොහෝ දෙනකුට අඳුරු වංකගිරි මඟ විවර විණි. මා මගේ වංකගිරිය හරහා ගොස් සාපේක්ෂ නිදහස් ලොවට යළි එනවිට ඇය සිටියේ නැත.**

වී බලා සිටියෙමි. බොහෝ විට මේ බලා සිටින අවස්ථාව අපේ ඉරණම තීන්දු කළේය.

එක්වරම දොර ඇරී මගේ ගෙල වටා දෑතක් එතී ගියේ වැලපෙන ස්වරයක් ද සමගිනි. ඒ ඇයයි. මා මෙන්ම රැකවරණය සහ මද විවේකයක් පතා එහි පැමිණි සිටි ඇය හැඬුවේ දුකට නොව සතුටටය. කතා කරන්නට හැකිවූ පළමු මොහොතේ ඇය කීවේ යළි මා දකින්නට ඉඩක් ලැබේ යැයි තමන් කෙසේවත් විශ්වාස නොකළ බවයි. ඊට හේතුව ඒ වන විට මා මරා දමා මගේ සිරුර හයිලෙවල් පාරේ විජේරාම හන්දිය ආසන්නයේ දැවෙමින් පැවතියේ යැයි තොරතුරක් හුවමාරු වෙමින් පැවති හෙයිනි.

ඒ අපේ අවසන් හමුවයි. අපි එකට කා බී ඉදිරියේ ඇති අවිනිශ්චිත එමෙන්ම බියකරු අනාගතය ගැන කතා කළෙමු. ඒ වන විට අපේ ජීවිතය ඉතාම අවදානම් තත්ත්වයකට පත්ව තිබූ බව හොඳටම පැහැදිලිව තිබුණ ද, ඇය පසුවූවේ අවසානය දක්වාම සිය දේශපාලන අරමුණ වෙනුවෙන් කැපවෙන්නෙමැයි යන අදිටන සමඟිනි.

එදා සන්ධ්‍යාවේදී මම ඇගෙන් සමු ගතිමි. ඇය එදින එහි නතර වූවාය. ඉන්පසු අප හමුවූවේ නැත. විජේවීර ඇතුළු ජවිපෙ ඉහළ නායකයන්ගේ ඝාතනයන් සමඟ අප බොහෝ දෙනකුට අඳුරු වංකගිරි මඟ විවර විණි. මා මගේ වංකගිරිය හරහා ගොස් සාපේක්ෂ නිදහස් ලොවට යළි එනවිට ඇය සිටියේ නැත.

මේ අශ්විනී ඉරේෂා පොල්ගම්පල සහෝදරිය පිළිබඳ මගේ සිත දවනා මතකයෙන් බිඳකි. අප යළි කිසි දිනෙක හෝ එකිනෙකා හමු නොවන බවට පසුගිය දශක කිහිපය විසින් සහතික ලබාදී හමාරය. එහෙත් එසේ අප හමු නොවූව ද අප අතර පැවති සහෝදරත්වයේ ඉමිහිරි මතකයන් මැකෙන්නේ නැත. ඒ මතකයන් සෑම වසරක් පාසාම අලුත් වෙයි. ඇය වන් බොහෝ දෙනෙකු අහිමි වීමේ වේදනාව දරාගෙන ගෙවෙනා අඳුරු හෝරාවන්හි නොවැටී සිටින්නට මට ශක්තියක් සපයන්නේ ද එවන් මිනිසුන්ගේ සදානුස්මරණීය මතකයන්මය. ජීවිතයේ ඉතිරිව පවත්නා කෙටි කාලය තුළ කරගසාගෙන යන්නට නියමව ඇති කුරුසය ඉතා බරය. එහෙත් මේ මිනිසුන්ගේ මතකයන් ඒ බර දරා සිටින්නට ජවය සපයන බව ද ඒ සමඟම ස්ථිරය.

ඉඳින් ඉරේෂා නැගණියනි, නුඹ අප අතර ඇතැයි මා කෙසේ නම් කියන්න ද?

නිමි.

▶ **චූලානන්ද සමරනායක**



# පොදු වැඩ කලාවක සොඳුරු මතක අද මේ තත්ත්වයට හේතු භූත වෙන්න ඇති!

## ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සෝමරත්න බාලසූරිය

සෝමරත්න බාලසූරිය විකල්ප සාහිත්‍යවේදයේ අසම්මත කලාකරුවෙකි. එසේම විරෝධාකල්ප සාහිත්‍ය නිර්මාණශීලීව පරිහරණය කළ ලේඛකයෙකි. අවිචාරවාදී විචාරකවේදයේ ජුගුප්සාව නිර්දය ලෙස ප්‍රතික්ෂේප කළ කලාකරුවෙකි. සමාජ සත්තාව ප්‍රතිනිර්මාණය කරනු වස් සෝපහසයෙන් ස්වකීය කතා කලාව නිර්මාණය කළ අයෙකි. මානවවාදී ආස්ථානයකින් යුක්තිගරුක මිනිසෙකු නිර්මාණය කිරීම උදෙසා සිය ලේඛන කලාව ප්‍රශස්ත අයුරින් භාවිත කළ මහාචාර්යවරයෙකි. ඔහු කතා කළේ ටිකය. එහෙත් හිතන්නට බොහෝ දේ ඒ තුළ අන්තර්ගත කළේය. පංති සමාජය තුළ යථාඥානය මැනවින් ස්පර්ශ කරමින් දේශපාලන සාහිත්‍ය කලාව ඔහු පරිභාවිත කළේය. ලාංකීය යථාර්ථය මතු කරමිනි. ඇල්බෙයා කැමූගේ 'පිටස්තරයා' ඔහු පරිවර්තනය කළේය. විශ්ව සාහිත්‍ය ධාරාවේ අපූර්ව අත්දැකීම් හේ සිංහල පාඨකයාට හඳුන්වා දුන්නේ විශ්ව සමාජ සත්‍ය ගවේෂණය කරමිනි. ඔහුගේ 'කරත්තය' කෙටි කතා සංග්‍රහය විකල්ප සාහිත්‍ය උළෙලේ හොඳම කෙටි කතාව ලෙසින් සම්මානයට පාත්‍ර වූ අතර රාජ්‍ය සාහිත්‍ය උළෙලේ හොඳම කෙටි කතාව බවට ද පත් විය. 'වප් මගුල' නව කතාව ලියා තැබූ ඔහු 4 තට්ටුවට ගමන් කිරීමට සිදුවීමෙන් නව කතාවේ කතා කලාවේ නිර්මාණශීලී විරෝධාකල්පයේ ප්‍රහසන යථාර්ථය කෙතරම් ප්‍රබල දැයි පසක් කරයි. ලේඛක විචාරක උභය පාර්ශ්වයන්හි ප්‍රාමාණික වියතෙකු වන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සෝමරත්න බාලසූරිය ඇත්ත ජීවිතය තුළ වාමවාදී දේශපාලනයට පෙම් බැඳි මිනිසෙකි. සාංදෘෂ්ටිකවාදය මෙන්ම භෞතිකවාදය ද, අධ්‍යයනය කළ වියතෙකි. ප්‍රංශ භාෂාව පිළිබඳ කීර්තිමත් පඬිවරයකු ලෙස ප්‍රකට ඔහු ප්‍රංශයේ සෝබෝන් විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධිධරයෙකි. 80 දශකයේ ධවල භීෂණයේ රාජ්‍ය ත්‍රස්තවාදයෙන් බේරීමට විදේශගතවී ජීවිතය බේරාගෙන පැමිණි නැවත මානවවාදී ආස්ථානයේම සිටගත් වියතෙකි. මිනිසෙකි.)

**■ ලාංකීය වාමවාදී දේශපාලන කඳවුරෙහි බුද්ධිමත් සම්ප්‍රදාය නියෝජනය කළ ඔබ 80 දශකයේදී ලංකාවේ ඉන්න බැරිව ගියා නේද? නන්දා මාලිනියත් සුනිල් ආරියරත්නත් ඉන්දියාවට යනවා. ආපසු හැරී බැලුවම මේ ගැන මොකද හිතෙන්නේ?**

වෙනස්වීම රටකට අවශ්‍යයි. වෙනස්වීම් මිනිස්සුන්ටත් අවශ්‍යයි. ඇත්ත වශයෙන්ම දේශපාලනයට මම සම්බන්ධ වෙලා කලාකාරයෙක් විදිහට මම යාපනයට යනවා. මේ ගැන කතා කරනවා. සිංහල විද්වතුන් එක්ක කතා කරනවා. කලාකාරයෝ එකතු කරනවා. 80 දශකය තීරණාත්මකයි. භයානකයි. ඒ වෙද්දී මම කැලණිය විශ්වවිද්‍යාලයේ වැඩ කළේ. විශ්වවිද්‍යාල වමට වැඩ කරන ශිෂ්‍ය ශිෂ්‍යාවෝ පුදුම භීෂණයකට මුහුණ දීලයි හිටියේ. අතුරුදහන් කරනවා. පැහැර ගන්නවා. පුච්චනවා. ධම්මචක්‍රයේ දානවා. ඇණ ගහනවා. බෙලි කපලා, වැටවල්වල ගහනවා. අපි මානව හිතවාදී ආචාර්ය සංගමයේ විදිහටත් මිනිස්සු වශයෙනුත් මේවට විරෝධය පෑවා. අපි බය නැතිව වැඩ කළා. ශිෂ්‍යයෝ තරුණයෝ වෙනුවෙන් කතා කළා.

ප්‍රා. සංවිධානය හදාගෙන පැරණි වමේ ඇතැම් අයත් සම්බන්ධ වී අවි ආයුධ අරගෙන ප්‍රගතිශීලී සටන්කාමී ශිෂ්‍යයෝ ඝාතනය කළා. අතුරුදහන් කළා. ඒ හින්දා අපි අපේ ශිෂ්‍යයන්ට ආරක්ෂාව සැලසුවා. ඉන්න තැන් හොයලා දුන්නා. කන්න වියදම දුන්නා. විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක් වීම නිසාම ඇතැමුන් මරලා දැම්මා. කොච්චර කැතද නින්දිතද? තාම ජීවතුන් අතර සිටින සමහර අයට මේ තත්ත්වය මතක ඇති කියලා හිතනවා.

**■ අතිශය භයානක තත්ත්වයක් ඇතිවී තිබුණා?**

ඔව්. සමහරෙක් පසුබැස්සා තවකෙක් බය නැතිව සටන් කළා. මේ තත්ත්වය සමහර අයට දැන් අමතක වෙලා. බිය වැද්දීම් කළා. ත්‍රිමා විතාන ශිෂ්‍යයා මැරුවේ ඇණ ගහලා.

අපිට අභියෝග ආවා. දුරකතන ඇමතුම් ආවා. තර්ජන කරලා. අතුරු හමුදා ඒකක ප්‍රා, කළුබළල්ලු, කොළ කොටි වැඩ පටන් ගෙන තිබුණේ. අපි එළියට බහිනකොට කෝල් එක එනවා. මිනීපෙට්ටි සාප්පුවට ඕඩර් එක දීලා යන්න කියලා.

**■ විශ්වවිද්‍යාලයේ අයත් මේ මර්දන අංශවලට සම්බන්ධ වෙලා සිටියද?**

ඔව්. විශ්වවිද්‍යාලවල ආචාර්ය මණ්ඩලයේ එවකට බලයේ හිටිය දේශපාලනඥයෝ සමඟ සම්බන්ධ වී සිටිය අයත් හිටියා. ඒ ආචාර්යවරුන් ඔත්තු දුන්නා. කොච්චර විනාශයක් කළාද? දරුණු තත්ත්වයක් ඇති වුණා. ඇඳිරි නීතිය රජයෙනුත් දානවා. දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයෙනුත් දානවා. යුද්ධයක්ම තමයි. අහිංසක මිනිස්සු, කිසිම දේශපාලනයක් නොකරපු ගෙදර නිදියගෙන හිටපු මිනිස්සු, මරලා පුච්චලා දානවා. අවිචාරාත්මක සමයක් සිදුවීම් පිළිබඳ ප්‍රවෘත්ති රේඩියෝවෙන් රූපවාහිනියෙන් පුවත්පත්වලින් ප්‍රචාරය කරනවා.

**■ ඔබ 4 වෙනි තට්ටුවට ගෙනියනවා. එදින ප්‍රධාන ප්‍රවෘත්තියක් බවට එය පත් වෙනවා මට මතකයි.?**

ඔව්. මම විශ්වවිද්‍යාලෙ ගිහින් හැන්දෑවේ ගෙදර ආවා. මට යම් යම් වෙනස්කම්වලින් තේරුණා අමුතු තත්ත්වයක් කියලා. රෑ නවයයි තිහට විතර ඇති. ආමි ට්‍රක් 4-5 ඇවිත් ගේ වට කරනවා.

එදා රාත්‍රියේ අමරදේවගේ වයලීන වාදනයක් රූපවාහිනියේ ගියා. ඒක මම අස අසා සිටියේ. මට ඇහෙනවා සපත්තු හඬ. අපේ ලේන් එකේ තරුණ ළමයෙක් මොකද කියලා හොයලා බලලා තියෙනවා හමුදාවෙන් කනේ පාරක් ගහලා එයාව එළවනවා. වයලීන් වාදනය, බල්ලාගේ බිරුම් හඬ, හමුදා අඩි ශබ්ද එක්ක හට පිරිස ගේ ඇතුළට ආවා. ජැකට් එක තුළ පිස්තෝල පේන්න තිබුණා. පරීක්ෂා කරනු නියෝග. මගේ පෞද්ගලික පුස්තකාලයේ පොත් රාක්ක තුළ පෙට්ටියක තැන්පත් කරපු ඡායාරූප විශාල ප්‍රමාණයක් ආරක්ෂාකාරීව තියලා තිබුණා. පරීක්ෂා කරන කොට ඒ පෙට්ටිය අහුවුණා. මැරුණු අයගේ පිංතූර ඒවා තුළ තිබුණා. අඩක් පිළිස්සුණු මිනී, කඹරයෝ කන මිනී. වධ දීලා අත පය වෙන් කරපු මිනී. ටයර්වලට බාගෙට පිච්චුණු මිනී, මළකඳන් 10-12 එකට දාලා ගිනි තියපු බාගෙට තැම්බුණු මිනී. මේවගේ විකෘති කරන ලද මිනී ආදී විශාල ඝාතන තොරතුරු ඒ ඡායාරූප එකතුවේ තිබුණා. මානව හිමිකම් සංවිධාන වලට යවපු අන්තර්ජාතික ලිපි ලේඛන විශාල සංඛ්‍යාවක් ඒවයේ තිබුණා. ප්‍රධාන පරීක්ෂක මේ පෙට්ටිය ගත්තා. 3 නිලධාරියාට යම් යම් වගකීම් පැවරුවා. මාව 4 වෙනි තට්ටුවට ගෙනියනවා.ඊට පස්සේ එහිදී ප්‍රධානියාට ටෙලිෆෝන් කෝල් එකක් එනවා. ඔව් සර්... හා සර්... හොඳයි සර්... එදා එතරම් ප්‍රශ්න කිරීමක් කළේ නැහැ. පසුවදා ප්‍රශ්න කළා. අනතුරුව විවේකයක් දෙනවා අපි කියපු දේවල් ගැන ඇත්තද නැත්තද කියලා අනතුරුව හොයා බලන බව මට තේරුණා. ඔවුන් සමඟ කථා කරන්න ඇත්ත කථා කරන්න මට හයියක් තිබුණා. මේ රටේ සිදුවන ඇත්ත තත්ත්වය මම කථා කළා. කථිකාචාර්යවරයකු වශයෙන් රටේ වගකීම පිළිබඳ මම ප්‍රශ්න කළා. මේ රටේ ජනතාව ගැන මම කථා කළා. තරුණයන්ගේ ශිෂ්‍යයන්ගේ ජීවිත ගැන මම කථා කළා. ඔවුන් ඇහුන්කන් දුන්නා. මම "මුක්ති" නවකතාව ලියුවේ මේ අත්දැකීම් පාදක කරගෙන. කොන්දක් නැති කැනහිල්ලු මේ නවකතාවේ යථාර්ථය ගැන කතා කළේ නැහැ. සත්‍ය වැහුවා.

වයලීන් වාදනය, බල්ලාගේ බිරුම් හඬ, හමුදා අඩි ශබ්ද එක්ක හට පිරිස ගේ ඇතුළට ආවා. ජැකට් එක තුළ පිස්තෝල පේන්න තිබුණා. පරීක්ෂා කරනු නියෝග. මගේ පෞද්ගලික පුස්තකාලයේ පොත් රාක්ක තුළ පෙට්ටියක තැන්පත් කරපු ඡායාරූප විශාල ප්‍රමාණයක් ආරක්ෂාකාරීව තියලා තිබුණා. පරීක්ෂා කරන කොට ඒ පෙට්ටිය අහුවුණා. මැරුණු අයගේ පිංතූර ඒවා තුළ තිබුණා. අඩක් පිළිස්සුණු මිනී, කඹරයෝ කන මිනී. වධ දීලා අත පය වෙන් කරපු මිනී. ටයර්වලට බාගෙට පිච්චුණු මිනී, මළකඳන් 10-12 එකට දාලා ගිනි තියපු බාගෙට තැම්බුණු මිනී. මේවගේ විකෘති කරන ලද මිනී ආදී විශාල ඝාතන තොරතුරු ඒ ඡායාරූප එකතුවේ තිබුණා.



තරුණ වියේදී



**■ ඊට පස්සේ මොකද වුණේ?**

රහස් පොලිසියේ ප්‍රධාන නිලධාරියෙක් මට කථා කළා. කාමරයට මාව කැඳෙව්වා. ඔබව නිදහස් කරනවා නමුත් ඔබ අපෙන් නිදහස් වුණාට මේ පරිසරයේ ඔබට ජීවත් වෙන්න සුදුසු නැහැ. පැහැදිලිද? නිලධාරියා මගෙන් ප්‍රශ්න කරනවා. අනතුරුව ඔවුන්ගේම රියෙන් මාව ගෙදරට ගෙනල්ල දාල බිරිඳට මාව බාරදෙනවා. (දිගු නිශ්ශබ්දතාවකි.) මට පුදුම හිතෙනව මේවා දැන් මතක් වෙනකොට.

**■ ඊට පස්සේ ඔබ විදේශ ගත වෙන්න තීරණය කරනවද?**

මගේ පුරුද්දක් තිබුණ උදේම නැගිටලා පොල්හේන්ගොඩ ඉඳලා නාරාහේන්පිටට ඇවිදිනවා. නදුන් සුරුට්ටු පෙට්ටියක් අරගෙන එකක් පත්තුකරගෙන දුම් පිටකර කර හිත හිතා ඇවිදිනවා. මේ අතර වේගයෙන් ආපු කාරයක් තද බ්රේක් පාරක් ගහලා නවත්තනව. මේක පොලිස් වාහනයක්. 4 වන තට්ටුවේදී මාව ප්‍රශ්න කළ 2 වන නිලධාරියා මාව බදාගන්නවා. මාව වැළඳගෙන. ඔබ නිදහස් වුණේ අපෙන් විතරයි. මොනවද මේ කරන්නේ. රටේ වෙන බලවේග ක්‍රියාත්මක වෙනවා. තේරුම් ගන්න. රටෙන් වහාම පිටවී යන්න කියනවා. මාව ඔහු ගෙදරට ඇරලනවා. ඊට පස්සේ ගෙදර අපි බිරිඳ සෝමා, පුතා වයඹ අරගෙන ලඟ තිබෙන බඩු මුට්ටු බෑග්වල ඇඳුම් පැළඳුම් දාගෙන පිටත් වෙන්න හදනවා. ඔය අතරේ කෝල් එකක් එනවා. ගියොත් අල්ලගන්නවා කියලා. 'අපි කලබල නොවී පිටවෙමු' කියලා එයාපෝර්ට් එකට යනවා. එයාපෝර්ට් එකෙන් ෆෝම් එක දෙනවා පුරවලා දෙන්න කියලා. පස්සේ ඔහුම මගෙන් අහල ඒක පුරවලා දෙනවා. අපි ඉන්දියාවට යනවා. 'ට්රිච්' (Trichy) එයාර්පෝර්ට් එකෙන් බහිනවා.

**■ ඔබ ඉන්දියාවට ගිහිල්ල ජීවිතේ බේරගෙන ඇවිල්ල නැවත විශ්වවිද්‍යාලයේ උගන්නනව නේද?**

ඔව්. ඊට පස්සේ චන්ද්‍රිකා ආණ්ඩුව වැටෙන්න යනකොට අපිට අදහසක් එනවා. මේ වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණ සම්බන්ධ කරගෙන හොඳ නැඹුරුවකට ආණ්ඩුව ගන්න පුළුවන් කියලා, පැලැන්තිය කඩලා බිඳලා වාමවාදී නැඹුරුවක් ඇති කරන්න පුළුවන් කියලා මම විශ්වාස කළා. මුලින්ම මම මංගල සමරවීර සමඟ කථා කළා. මියැදුණු ශ්‍රීපති සූරියආරච්චි සම්බන්ධකරගත්තා. රහසිගතව තමයි සියල්ල සිද්ධ කළේ. කලාකාරයොත් කීපදෙනෙක් සම්බන්ධ කර ගත්තා. මම කිව්ව අපේ ගෙදර ගිහිල්ලා සාකච්ඡා කරමු කියලා. ආරක්ෂක ප්‍රශ්නයක් මත කියල හොඳ තැනක් හෙව්වා. B.R.C. එකේ ක්‍රීඩාංගණය තෝරා ගත්තා. නමුත් ඒ අසළ හමුදා අනුකණ්ඩයක් තිබුණා. පරිස්සමින් රහසේ හමුවුණා. මම පිට්ටනියට පුටු 3ක් ගෙනිච්චා. කට්ටිය වෙන වෙනම ඇවිල්ල සාකච්ඡා කෙරුවා. අර්ජුන රණතුංගගේ අයිය කෙනෙකුත් මේකට සම්බන්ධ වුණා. පස්සේ මේ සාකච්ඡාව වැඩිපුර ගෙනිච්චේ කෝට්ටේ බුද්ධිලෑ ගෙදර. දැන් ඉන්න අයගෙන් කීපදෙනෙක් ආවා මතකයි. ටිල්වින් සිල්වා ආවා. දැන් පක්ෂයේ තුන් දෙනෙක් සම්බන්ධ වුණා. විමල් වීරවංශ ආවා. තව කිපදෙනෙක් ආවා. අපි යෝජනාව ලිව්වා. එක්කාසුවීමෙන් වාමවාදී රජයක් ඔස්සේ ගිය නැති බව වෙනම කතාවක්. සම්බන්ධීකරණය බාරවුණේ මට. සාකච්ඡා කරලා ලියපුව අරන් ගියේ මම. මෙහෙම ලියුම් කීපයක් හුවමාරු වුණා. ප්‍රතිපත්ති කොන්දේසි උපාය වගේ දේවල්.

**■ එසේනම් ජ.වි.පෙ. - චන්ද්‍රිකා රජය සහසම්බන්ධ කරන්න ඔබ උපකාර කළා නේද?**

ඔව්. මේවා ලියාගෙන ගියහම චන්ද්‍රිකා මා එක්ක හිනාවෙලා ඇහුවා, 'ඔයානේද බාලා මේවා ලියන්නේ?" කියලා. හිනාවෙන් මට තේරුණා මුලින් තිබුණ විරෝධය ක්‍රමයෙන් අඩුවී යන ආකාරය. ඊටපස්සේ එකඟතාවට ආවා, ඇමතිකම් කීපයක් දෙන්න. වත්මන් ජනාධිපති අපේ අනුර කුමාර දිසානායකට කෘෂිකර්ම අමාත්‍යාංශය හිමිවුණේ එහෙමයි. අපේ ලාල්කාන්තටත් ඇමතිකමක් ලැබෙනවා. විජිත හේරත්ට ඇමතිකමක් ලැබෙනවා. අපේ සමන්ත විද්‍යාරත්නට නියෝජ්‍ය ඇමතිකමක් ලැබෙනවා. ටික කාලයක් ඒ ඇමතිකම් කළත්, රටට දැනෙන්න, මිනිස්සුන්ට හිතන්න යමක් ඉතුරු කරලා පඩි ගන්නේ නැතිව, පොදු සුබසාධනයට තමන්ගේ වැටුප පරිත්‍යාග කරපු සුන්දර මතකයක් ජනතාවට ඉතුරු කරපු කාලයක් ඒක. පොදු වැඩ කලාවක සොඳුරු මතක අද මේ තත්ත්වයට පත් වෙන්න හේතු භූත වෙන්න ඇති.

සංවාද සටහන

▶ ධර්ම බුලත්සිංහල

ප්‍රවේශ
වියත් සංවාදයට පෙරවදනක්

කුඩාකාලයේ සිට ඇය දුටු සිහිනය සැබෑකරගැනීමට එමා ගිනි නිවීමේ පුහුණු ආයතනයට බැඳුණි. පිරිමි වෘත්තිකයන් බහුලව සිටින ක්ෂේත්‍රයක් බැවින් පුහුණුවට පැමිණ සිටියේ කාන්තාවන් අතලොස්සක් පමණි. මෙම ජීවිත බේරාගැනීමේ වෘත්තිය සඳහා හුදෙක් කායික ශක්තිය පමණක් නොව මානසික ඔරොත්තුදීමේ හැකියාවද, අතිශයින් අවශ්‍ය බව පුහුණුව අතරතුරදී ඇයට ඉක්මණින්ම අවබෝධ විය. අධික බර ඉසිලීම හෝ දුෂ්කර තත්ත්වයන්ට විඳ දරාගැනීම වැනි පුහුණු අභ්‍යාස සැබෑ ජීවිත ගලවා ගැනීමේ අවස්ථාවලදී පුහුණු කිරීම සඳහා නිර්මාණය කර ඇති බැවින් ඒවා ඉතා දුෂ්කර වුවත්, එමා තමන්ගේ දක්ෂතාවයන් එළිදක්වමින් තමන්ගේ සමකාලීනයන් හා සමානවම ඉතාමත් හොඳින් පුහුණුවෙහි නිරත වුණා විතරක් නෙමෙයි, පුහුණුකරුවන්ගේ මෙන්ම තම සමකාලීන සහෝදරයන්ගේද ගෞරවයද දිනා දිනාගත්තාය.



# ගැහැනු ශරීර සමග ගිනි නිවීම ගැනීම ද?

එක් දිනක දිවා ආහාර විවේකය අතරතුරදී උණුසුම් සංවාදයකි. එහා නගරයේ ගිනි නිවීම් දෙපාර්තමේන්තුව විසින් ස්වකීය කාන්තා සහභාගීත්වය වැඩිකිරීමට බඳවාගැනීමේ කොන්දේසි සහ පුහුණුවට අදාළ යෝග්‍යතා පරීක්ෂණවල ප්‍රමිතිය අඩු කිරීමේ සූදානමකි. මයික්, එම ආරංචිය සෙසු අය සමග බෙදාගත්තේය.

“මොන මෝඩ වැඩක්ද ඒක? ”ආරංචිය අහපු තවත් කෙනෙක් කීවේ එහෙමය.

“මේක තමයි පරීක්ෂණය, ඉතින් ඒකට හොඳට මූණදෙන්න බැරිනම් එහෙම අය බඳවාගෙන ඇති වැඩේ මොකද්ද? තවත් අදහසක් මතුවුණා. “අපිටත් පිරිමි අය කරන හැම දේම කරන්න පුළුවන්”කියලා කියනගෑනුන්ට ගිනි නිවන පුහුණු පරීක්ෂණයකට මූණ දෙන්න බැහැ? ඒකද කියන්නේ? හැමෝම එමා දිහා බැලුවා. එයා හිමින් මාරුවුණා. ඇත්තටම ටිකක් ලේසි කරානම් කොච්චර හොඳද කියලා පුහුණු අභ්‍යාස මතක් කරමින් එමා හිතුවා. කාන්තාවන් වැඩි වැඩියෙන් ඉන්නවා නම් මටත් හොඳයි. එමා සිතුවේ එහෙමයි.

පුහුණුව අතරතුර දිනක් සැබෑ දිවි ගලවා ගැනීමේ මෙහෙයුමකට සහයෝගය දීමට එමාට අවස්ථාවක් ලැබුණා. හොඳටම ගිනිගනිමින් තිබුණු ගොඩනැගිල්ලේ මිනිසුන්  බේරගැනීමට කාලයත් එක්ක තරග කරමින් සිටි සහෘදයෙකු එකවරම සිහිසුන්ව ඇද වැටුණා. එක් අයෙකු හෝ ඇදගෙන වැටීම මෙවැනි වෙලාවක බොහෝ දරුණු තත්ත්වයක් බව එමාට වැටහුණේ ඒ මොහොතේදීය. හැමෝම තම උපරිම ශක්තියෙන් සහයෝගයෙන් වැඩකරපු නිසාම ඒ අනපේක්ෂිත තත්ත්වය ඇතුළෙත් මෙහෙයුම සාර්ථක කර ගැනීමට හැකිවුණා.

ඒත් ඒ සිදුවීම එමාගේ මතකයෙන් ඉවත් වුණේම නැත. එයාට තවත් දෙයක් හිතුණා. මේ තරම් අමාරු පුහුණුවීමක් ලැබිලත්, ඒක හොඳින් කරපු කෙනෙක් වෙලත්, ඒ සහෘදයාට අදාළ අවස්ථාවේ ඒ ආතතිය දරාගත නොහැකිව සිහිසුන් වූවා නම්, කාන්තාවන්ට වැඩි අවස්ථාවක් දීමට බඳවා ගැනීමේ සහ පුහුණු කිරීමේ ප්‍රමිතිය අඩු කිරීමෙන් පුහුණුව ලබන අය ජීවිත බේරාගැනීමට ගිය විට කුමක් වෙයිද? එමාට හිතුණා. මෙම තත්ත්වය කාන්තාවන් දිරිමත් කිරීම, සවිබල ගැන්වීම වැනි සීමා සහිත කතිකාවක් තුළ වටහා ගැනීම ප්‍රමාණවත් නැත. කවුරුන් කුමන තනතුරට පැමිණියද, ඒ පුද්ගලයාට කාර්යක්ෂමව තමන්ගේ රාජකාරිය ඉටු කිරීමට හැකිවිය යුතුය. සමස්ත කණ්ඩායමේ මෙහෙයුමට ඉතාමත් හොඳින් මුහුණ දීමට හැකි විය යුතුය. නැත්නම් මෙවැනි ජීවිත බේරා ගැනීමේ වෘත්තියක් මෙන්ම අනෙක් වෘත්තීන් තුළත් ගුණාත්මකභාවයට එය අනිවාර්යයෙන්ම බලපානු ඇතැයි එමාට හිතුණා.

‘ගිනි නිවීමේ‘ රාජකාරියට කාන්තාවන් බඳවා ගැනීම සඳහා යෝග්‍යතා පරීක්ෂණ වෙනස් කිරීම යනු මේ වන විට ලෝකය පුරා ඇතිවී පවත්නා සංවාදයක් පමණක් නොවේ. අමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව සහ



ඕස්ට්‍රේලියාව තුළ සමහරක් ප්‍රාන්තවල ගිනි නිවන දෙපාර්තමේන්තු බඳවා ගැනීමට අදාළ වන ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ දැනටමත් වෙනස් කර තිබේ. කැනඩාවේ ඇතැම් දෙපාර්තමේන්තු සම්ප්‍රදායික පර්යේෂණ වෙනුවට කාන්තාවන්ට විකල්ප පර්යේෂණ හඳුන්වා දෙනු ලැබිණි. එක්සත් ජනපදයේ ලොස්ඇන්ජලීස් ගිනි නිවීමේ දෙපාර්තමේන්තුව 2014 දී කාන්තාවන්ට පවත්නා ශාරීරික පරීක්ෂණය ලිහිල් කිරීමනිසා දැඩි විවේචනයට ලක්විය. ඕස්ට්‍රේලියාවේ නිව්සවුත්වේල්ස් ගිනි නිවන හමුදාව විසින් 2018 දී ස්ත්‍රී-පුරුෂභාවය අදාළ කර නොගන්නා නිර්ලිංගික ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයක් හඳුන්වා දෙන ලදී.

ශාරීරික ශක්තිය, අවදානම, අනතුරුදායක භාවය මෙවැනි වෘත්තීන්වල සේවය කරන එමා වැනි බොහෝ කාන්තාවන් තම පුහුණු කාලය තුළ මෙන්ම වෘත්තිමය ජීවිතයේදීත් මුහුණදෙන අභියෝගයන්ය. නමුත් එම ක්ෂේත්‍රයේ නියැළෙන පිරිමි වෘත්තිකයන් ද, ඊට සමාන අභියෝගයන්ට මුහුණ දෙන බව එමාගේ මතකයට නැඟුණි. එම අභියෝග තීරණය වන්නේ ලිංගිකභාවය නිසා නොව වෘත්තියේ ඇති අවදානම් ස්වරූපය නිසා බව එමා දැන සිටියාය.

පුරුෂාධිපත්‍යය පිළිබඳ විවාදය මතුවන්නේ තවමත් පවතින බොහෝ අසාධාරණ කොන්දේසි නිසා වුවත්, ලොව පුරාම නීති, සමාජ ව්‍යුහයන්, සහ සමාජ තත්ත්වයන් නිරන්තරයෙන් වෙනස් වෙමින් පවතී. එබැවින්, අප සෑම විටම එම පවතින සංදර්භයට සාපේක්ෂව දේවල් තේරුම් ගැනීම අතිශය වැදගත්ය.

ස්ත්‍රී -පුරුෂ සමානාත්මතාවය අත්‍යවශ්‍ය ඉලක්කයක් වුවද, ලෝකය තුළ පවතින සියලුම ගැටලු සහ තත්ත්වයන් ඒකරේඛීය ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය පිළිබඳ කාචයකින් පමණක් නොබැලීමට අප වගබලා ගත යුතුව ඇත.

නදී ජයවීර

ප්‍රවේශ

වියත් සංවාදයට පෙරවදනක්

# පිස්සු හැටි ද? ප්ලෑන් B

**ප්‍රසුගිය නොවැ 14 දින පැවැත්වූ මහමැතිවරණියෙන් යාපන දිස්ත්‍රික්කයෙන් මනාප ඡන්ද 24000 ක් ලබා පත්වූ ස්වාධීන මන්ත්‍රීවරයා, අර්චුනා රාමනාදන් පසුගිය 21 වෙනිදින පාර්ලිමේන්තු සභා ගර්භයේ විපක්ෂ නායක පුටුවේ වාඩිලා ගැනීම ඇතුළු තවත් ක්‍රියාවන් හා කළ ප්‍රකාශ ගැන ආන්දෝලනාත්මක කතිකාවන් බොහෝමයක් මාධ්‍ය තුළ ලියැවෙමින් තිබේ.**



පා.ම. අර්චුනා රාමනාදන්

ඔහුගේ එම හැසිරීම තුළ, ඔහු පිස්සෙකු, ජාතිවාදියෙකු,සහ කැපී පෙනීමට ආසා ඇත්තෙකු ලෙස කරුණු දක්වා, ඒ ආශ්‍රිත විග්‍රහයන්ගෙන්ද සමාජ මාධ්‍ය පිරී ඉතිරී පවතී. මෙහි භයානකම විග්‍රහය තුළ දකින්නට ඇත්තේ රාජපක්ෂ දේශපාලනය තුළ පිබිදී සිට,ගෝල්ෆේස් අරගලයෙන් පසු තටු හකුළාගෙන සිටි ජාතිවාදීන් මෙම සිද්ධිය දඩමීමා කරගෙන ඔවුන්ගේ සුපුරුදු ජාතිවාදී කතිකාව ඉස්මත්තට ගෙන ඒමට කරන උත්සාහයන්ය.

රාමනාදන් මන්ත්‍රීවරයාගෙන් සිද්ධියට අදාළව ප්‍රශ්න කළ විට,ඔහුගේ තර්කවල අඩුපාඩුකම් තිබුණද, ඔහු එම වැරැද්ද සිදුවීමට අදාළ දැනුවත් කිරීම් තමාට නොලැබුණු බව කියා සිටිමින් එම වරද අන් අය මත පැටවීමට උත්සාහ දරනු පෙනුණි. එහිදී ඔහු සූර කපටි දේශපාලන තාර්කික භූමිකාවක් රඟ දැක්වීය.ඔහුගේ දේශපාලන ව්‍යපාර හා මැතිවරණ කටයුතුවලදීද, ඔහුගේ මෙම සූර, කපටි දේශපාල ක්‍රියාවන් දැක ගත හැකිය. වරෙක මොහු මැතිවරණයේ රැල්ල පැත්ත සලකාලමින් එන්පීපී එක සමඟ ඩීල් එකක් දමා ගැනීමට උත්සාහ කළේය. තවත් විටෙක දමිළ ඩයස්පෝරාවේ නියෝජිතයෙකු වශයෙන් පෙනී සිටිමින් ප්‍රකාශ නිකුත් කළේය. මේ සියල්ල එකිනෙකට පටහැණිව තිබු ප්‍රතිවිරෝධතා බහුල ක්‍රියා වුවද, ඔහුගේ ඉලක්කය වූයේ කෙසේ හෝ මන්ත්‍රීකමක් දිනා ගැනීමය. අවසන ඔහු ඉලක්කය ළඟා කරගත්තේය.

ජනාධිපතිවරයා10 වන පාර්ලිමේන්තු සැසි වාරය ආරම්භක කතාවේ අවධාරණයෙන් කියා සිටියේ මින් පසු තව දුරටත් ලංකාව තුළ කිසිදු ජාතිවාදී ආගම්වාදී කෝලාහල හෝ ඒ ආශ්‍රිත කිසිදු උත්සාහයකට ජාජබ ආණ්ඩුවක් යටතේ කිසිඳු ඉඩක් නොලැබෙන බවය. ඒ අනුව යමින් කල්පනා කළවිට මෙම නවක මන්ත්‍රීවරයාගේ සමහරක් ප්‍රකාශ ඔහු තමාව ස්ථානගත කරවා ගැනීමට අමතරව.දකුණේ රාජපක්ෂලාගේ ව්‍යපෘතියේ සිටි නාමල් කුමාර,උදය ගම්මන්පිල, චන්න ජයසුමන වැනි ජාතිවාදී කොටස්වලට ෆුල් ටොස් පන්දුවක් දීමෙන් කර ඇත්තේ දකුණේ පණ අදිමින් සිටි ජාතිවාදයට හුස්ම පිඹීම ට අවකාශයක් ලබා දීමය.

තවත් පැත්තකින් උතුරේ බහුතර දේශපාලන සාක්ෂරතාවක් සහිත ක්‍රියාකාරී ජනයා මෙවර තමන් කලින් සිටි ස්ථාවරයට වෙනස්ව ක්‍රියාකරමින් තම ජාතික වාර්ගික අනන්‍යතාව නියෝජනය කළ මන්ත්‍රීවරු වෙනුවට එසේ නොවන සියලු ජාතීන් සම්බන්ධයෙන් පොදු ප්‍රතිපත්තියක් මත පිහිටා ක්‍රියාකළ දකුණේ පක්ෂ ලෙස නාමකරණය කළ ජාතික ජන බලවේගයට තම මනාපය පළ කරමින් දිස්ත්‍රික්ක කීපයක බලය හිමිකර දී, එහි මන්ත්‍රීවරුන් මුල් තැනට ගෙන ඇත.

එම තත්ත්වය හමුවේ උතුරේ ජාතිවාදීව දේශපාලනය කළ කණ්ඩායම්ද වික්ෂිප්තවී ඇති බවට හොඳම උදාහරණය නම්,මෙම ස්වාධීන මන්ත්‍රීවරයාගේ හැසිරීමය. ඔහු මේ කරමින් සිටින්නේ අතීතයේ තිබූ දමිළ ජාතිවාදී සටන් පාඨ යම් තරමකින් ඉදිරියට ගෙන ඒමට කටයුතු කිරීමය. එසේ කිරීමෙන් ඔහු බලාපොරොත්තු වන්නේ කවදත් කිසියම් හෝ දුරකට ඉතිරිවී තිබෙන, සහ නැවත දවසක මතුකිරීමට අවස්ථාවක් උදාකරගත හැකි ජාතිවාදය නියෝජනය කරවන එකම නියෝජිතයා ලෙස තමන් උපරිමයෙන් භෞතිස්ම කර ගැනීමය.


ඔහු තමා ජයග්‍රහණයට යොදවා ගත් ප්‍රතිපත්තියක් නැති, වැනෙන, අරාජික, සිල්ලර ජනප්‍රියත්වයම නැවත නැවත උරගා බැලීමට මෙවර පාර්ලිමේන්තුව තුළ ලාබ තොරම්බලයක් වීමට දැනුවත්වම ඉදිරිපත් වී ඇත.කෙසේ වුවද අදවන විට තමගේම එම ක්‍රියාව තමාටම පාරා වළල්ලක් වන බවටද ඔහු දැනුවත්ය. ඔහු මේ උරගා බලන්නේ ජාජබය උතුරෙන් ලබාගත් ඡන්දවල තිබෙන ලිට්මස් පරික්ෂාවයි. ඔවුන්ව බිත්තියට හේත්තු කරවන වැඩ පිළිවෙළයි.

ප්‍රභාකරන් දෙමළ ජනය අතර වීරයෙකු, දෙවියෙකු,සටන්කාමියෙකු, ලෙස හෝ ඝාතකයෙකු ත්‍රස්තවාදියෙකු, අපරාධකරුවෙකු ලෙස සලකන අයද සිටී. එහෙත් සිංහල සහ දමිල ජාතිකවාදය තවමත් යථාර්ථයක් ලෙස ගත්කල ජාතික ජනබලවේගය ට ඡන්දය දුන් දමිළ අය අතරද, එසේ කල්පනා කරන අය සිටීම යථාර්ථයක් ලෙස අපට පිළිගැනීමට සිදුවේ. එනම් ප්‍රභාකරන් දෙවියෙකු හෝ තම ජාතියේ ගැලවුම් කරුවෙකු ලෙස ප්‍රසිද්ධියේ ප්‍රකාශ නොකරන තම පුද්ගලික ජීවිතයේ ආත්මීයව සලකන මිනිසුන් උතුරේ ඡන්ද දායකයන් අතරද සිටිය හැක. අර්චුන් සිංහල ප්‍රජාව අතර ප්‍රභාකරන්ව දෙවියෙකු කරමින් කරන ප්‍රසිද්ධ ප්‍රකාශය නිසා ඇවිළෙන සිංහල ජනයාව උතුරට පෙන්වා ඔවුන්ගේ ආත්මීයත්වය හෙළවීම් හරහා ජනයා අතර බෙදීමක් හට ගැන්වීමට දැනුවත්ව සිදු කරන සහාසික උත්සාහයයි. ජාතික ජන බලවේගයට තාක්ෂණිකව ළංවූ උතුරේ ජනයා තුළ වේලාසනින්ම පැල්මක් සෑදීමට කටයුතු කිරීමය.

තහනම් සංවිධානයක් වෙනුවෙන් ප්‍රසිද්ධියේ පෙනී සිටීම හා ඒවා උත්කර්ෂයට නැංවීම නීතිමය වරදක්ව තිබියදී, එය දැන ගෙනම අර්චුනා මන්ත්‍රීවරයා සිදුකරන ක්‍රියාවලිය තුළින් පෙනීයන්නේ ඔහු පිස්සෙකු හෝ වෙනත් නාසිස්ම තත්ත්වයක් තුළ ඔහු කටයුතු කරනවා නොව දේශපාලන භාෂාවකින් කියන්නේ නම් අසාර්ථක උත්සාහයක් වුවද අනාගතයෙන් බලා උතුරේ නාඩිය ඇල්ලීමට තවත් වටයකින් උත්සහ කරන කෙනෙකු වශයෙනි.

**කළ්‍යා පෙරේරා**

## පොතකින් හිතකට




සෑම අදහසක්ම ආරම්භ වන්නේ හෙළාදැකීම්, අපවාදයන් ඇතුළු මඩගොහොරු තුළ එරෙමිනි. එය වේදනා විඳිමින් එම මඩගොහොරුව තුළින් එළියට පැමිණ, තියොරොමයක් දක්වා හෝ නොබිඳිය හැකි සත්‍ය කරුණක් දක්වා තත්ත්වයට උසස්වීම් ලබයි. මෙය දර්ශනවාදීව අමාරු කාරණයක් නොවේ. ඉතා පුළුල්ව 'පිළිගත් අතීත විශ්වාසයන් ඒත්තු ගන්වන තරම් සුළු ලෙස ඔප්පු කරන ලද්දේ දෝෂයන් සහිතවය' යන කාරණය, අනාගතයේදී ලැබෙන සාක්ෂි මගින්ද, වැරදි යයි ඔප්පුවනු ඇති බවට බිය විය යුතු යයි ඉන් අදහස් නොකෙරේ. අපගේ වර්තමාන විශ්වාසයන් බිඳවැටීම සිදුවීමට නම්, ඒ සඳහා බොහෝ කරුණු අවශ්‍ය වේ. ඒවා අතරින් ඉතා තීරණාත්මක වන්නේ මේ විශ්වාසය වෙනුවෙන් පවතින සාක්ෂි කොතරම් ශක්තිමත්ද, යන්න වේ. කලක් සූර්යයා පෘථිවියට වඩා කුඩා යයි මිනිස්සු සිතුවෝය. ඒ වෙන ආකාරයකට සිතීම සඳහා අවශ්‍ය තරම් සාක්ෂි ඔවුන් වෙත නොතිබූ බැවිනි. දැන් අපට ඕනෑ තරම් සාක්ෂි තිබේ. මේ සාක්ෂි විසින් ඉතා නිවරද්‍ය ලෙසින් සහ තීරණාත්මක ලෙස සූර්යයා පෘථිවියට වඩා විශාල බව පෙන්වාදෙන අතර මේ සාක්ෂි කිසිම දිනක අවලංගු නොවන බවට අපට මහත් විශ්වාසයෙන් යුතුව සිතිය හැකිය. එය වැරදියයි පෙන්වාදීමකින් බේරී සිටින තාවකාලික කල්පිතයක් නොවේ. අප දරන්නා වූ බොහෝ දේ පිළිබඳ විශ්වාසයන් සමහරවිට බිඳහෙළීමට ලක්විය හැකිය. එහෙත් ඉතා විශ්වාසයෙන් යුතුව කිසිදා බිඳිය නොහැකි බවට අප දන්නා සමහර සත්‍ය කරුණු ලැයිස්තුවක් පිළියෙළ කළ හැකිය. පරිණාමය හා සූර්ය කේන්ද්‍රවාද සැමදා ඒ ලැයිස්තුවේ තිබුණේ නැත. එහෙත් ඒවා දැන් ඒ ලැයිස්තුවේ ඉහළින්ම පවතී.

ජීව විද්‍යාඥයෝ නිතරම පරිණාමය නැමති සත්‍ය කරුණ (සියලුම ජීවී දේවල් එකම මූලාශ්‍රයකින් පැමිණි ඥාති සොයුරන් වේ) සහ එය සිදුවන යාන්ත්‍රණය පිළිබඳ සිද්ධාන්තය (සාමාන්‍යයෙන් එම යාන්ත්‍රණය ලෙස අදහස් කරන්නේ ස්වභාවික වරණය පිළිබඳවයි. ඒ මතයට තරගකාරී වෙනත් මත වලින් එය වෙන්කොට සලකයි. උදාහරණයක් ලෙස ලැමාක් විසින් ඉදිරිපත් කරන ලද " භාවිතය හා අභාවිතය" මෙන්ම මෙන්ම "අත්කරගත් ලක්ෂණ ප්‍රවේණිවීම" වැනි මතවාද වෙතිනි.) එකිනෙකින් වෙන්කොට සලකති. නමුත් ඩාවින් මෙම සිද්ධාන්තය තාවකාලික, අනුමානික නැතහොත් කල්පිත ලෙස සලකන ලදී. ඒ මන්ද යත් ඒ කාලයේ පැවතුණු සාක්ෂි එතරම් බලවත් නොවූ බැවින් සහ ගෞරවනීය විද්‍යාඥයෙකු විසින් පරිණාමය සහ ස්වභාවික වරණය යන දෙකම මතභේදයට ලක්කිරීමට ඉඩකඩ තිබූ බැවිනි. එහෙත් වර්තමානයේ නම් ඒවා බිඳ හෙළීමට කිසිදු හැකියාවක් නැත.

( රිචර්ඩ් ඩෝකින්ස් - 'මිහිමත විශිෂ්ටතම සංදර්ශනය-පිටුව 22).



ඡායාරූපය - වෛද්‍ය මංගලනාත් උඩුකල

# ඉසිඹුවක නිමේෂය!

**මිනිසෙකු තවත් මිනිසෙකු හා සිටී. මේ යම් තාවකාලික නිමේෂයකි. තේමාත්මකයට අනුව බලන විට යම් විවේකී මොහොතකි. නමුත් තත්‍ය කාලය නිසලකොට නිමවා ගත් රාමුවෙහි අප මේ මිනිසා පෙර ගත කළ ශ්‍රමවාහී වූ වෙහෙස නොදකිමු ද?**

**ඡායාරූපය යනු කුමක්දැයි අතිශය කලාත්මක මානයන්ගේ සිට දේශපාලනික කේන්ද්‍රයන් දක්වා නෙක අරුත් ගැන්වීම් භාෂා ලෝකය තුළ දක්නට ලැබේ. එසේම එය තාක්ෂණික ධනවාදයේ ප්‍රබතලම හා සුලබම සෞන්දර්ය උපකරණයයි යන්න පිටුදැකිය නොහේ. උදාහරණයකට සියලු ජනයා විනෝදයේ නියැළෙන "අනුන් තමා දැකිය යුත්තේ කෙලෙසද?" නොඑසේනම් "අනෙකාට තමාව පෙනිය යුත්තේ කෙළෙසද?" යන්න ස්වයං ප්‍රති නිර්මාණයකට අවශ්‍ය අතිශය සැහැල්ලු කැමරාවකුත්, නිසල කළ මොහොත පසු සංස්කරණයකට බඳුන් කළ හැකි මෘදුකාංගමය හැකියාවකුත් ඔබගේ හා මගේ සාක්කුව තුළ වේ.**

මෙම ඡායාරූපය දෙස ඔබ මොහොතක් නෙත් හෙළන්න. පළමුව දැනෙනු ඇත්තේ එහි කිසිදු අතිශයෝක්තියක් නොමැති බවය. නිවැරදිය. අධි සංස්කරණයකට මෙය ලක්ව නැත. ප්‍රකාශනය කළු-සුදු වෙනි. එසේම මෙය දුරකථන කැමරාවකින් ලබා ගත් සේයාරුවක්ද, නොවේ. DSLR හෝ මිරර්ලස් පන්නයේ වෘත්තීය කැමරාවකින් බොහෝ විට සටහන් කරගෙන ඇතුවා විය යුතුය. ඡායාරූප ශිල්පියා මේ වන විට යුරෝපයේ වෙසෙන වෛද්‍ය මංගලනාත් උඩුකල ය.

"මගේ ඡායාරූපයට බඳුන් වූ අපගේම ප්‍රතිබිම්බ බඳු මිනිස්සු සියවස් ගණනාවක පරාරෝපිත මෘත ශ්‍රමයේ බර මොහොතකට බිම තැබුවෝ වෙති. ජීවන බර ලෙස අප හඳුන්වන ඉහත නිශ්චිත බර විසින් බන්ධනගත විවේකය ඔවුන්ගේ සිනහවක, කල්පනාවක, නිහඬ හුදෙකලාවේ බැල්මක හෝ තැති ගැන්මක නින්නාද වනු පෙනේ.

"නිමේෂ" නම් උදෘතය ඔස්සේ කලකට පෙර පැවැත්වූ සේයාරූ දැක්මක 'විවේකී මිනිස්සු නම්' අනු තෙමාත්මකය ඔස්සේ ගෙන ආ මේ සේයාරුව පිළිබඳ මංගල විසින් එසේ ලියා තබා ඇත. කැමරාසන්තකයින්ගේ ජනප්‍රිය භාවිතාවක් වන පසු සංස්කරණයෙන් වැඩි උද්දීපනයක් මතු කැරෙන , මතුපිට නාටකීය සෞන්දර්යයේ වසඟයට නතු නොවී රූපය තුළ මෙය කියවිය හැකිය.

මිනිසෙකු තවත් මිනිසෙකු හා සිටී. මේ යම් තාවකාලික නිමේෂයකි. තේමාත්මකයට අනුව බලන විට යම් විවේකී මොහොතකි. නමුත් තත්‍ය කාලය නිසලකොට නිමවා ගත් රාමුවෙහි අප මේ මිනිසා පෙර ගත කළ ශ්‍රමවාහී වූ වෙහෙස නොදකිමු ද?

කෙස්සෙන්ද, රැවුලින්ද, නළලතින්ද මුහුණ මත ද, දෑත් ඉරියව්වෙන්ද, එක එල්ලේ නොමැති මුත් උහු දෑස් බැල්මෙන්ද, රූපය අප හා සංවාදයේ යෙදෙයි. ඒ අතර වැදගත්ම දෙය බැඳීරුම් බවක් තුළ නමුදු තාවකාලික ඉසිඹුවේ සැහැල්ලුව මඳක් තැවරී තිබීමය. කිනම් සමාජ අර්ථ ක්‍රමයක් යටතේ වුව ද, මිනිසා ගෙවන ශ්‍රමික දිවිය අතර එය විඳීමේ අවස්ථාව පුළුල් වීම වැදගත් බව දියුණු රටක ලකුණක් මුදු, යළිත් අවිවේකය චක්‍රයක් මෙන් විවේකය මත පතිත වන බව අපි දනිමු. එවන් පසුබිමෙක විවේකය නම් අර්ථය ජීවිතයට අවශ්‍ය බව මේ මිනිස් අලේඛ්‍ය රුව අපට සන් කරයි.

වැදගත්ම කරුණ විවේකයෙන් මිදිය යුතු වන මේ මිනිසාගේ ඊළඟ මොහොත ද සේයාරුව තුළින්ම අපගේ දැක්මට හසු වීමයි. එය ජීවිතය හා ඒ ගැන රටාව වෙනත් මානයක සිතීමකට අප රැගෙන යයි.

▶ **විකුම් ජිතේන්ද්‍ර**

- කවර නිර්මාණය
  **ගන්දික ධර්මබන්දු**
- පිටු සැකසුම
  **දීපාල් සංජීව සරත්මදු**

වර්ෂ 2024ක් වූ නොවැම්බර් මස 27 වැනිදා බදාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.